# Path to Success – Study Pack

## දෙවන වාරය සඳහා ඉගෙනුම් අත්වැල

## පුරවැසි අධ්‍යාපනය - 11 ශ්‍රේණිය



අධ්‍යාපන සංවර්ධන අංශය
කලාප අධ්‍යාපන කාර්යාලය - කැළණිය

**උපදේශනය හා අධීක්ෂණය**

පී.ඩී.ඉරෝෂිනී කේ. පරණගම මිය

කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ

**මෙහෙයවීම හා සංවිධානය**

එෆ්.එච්.ජේ. පී. සිල්වා මයා

නියෝජ්‍ය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ ( අධ්‍යාපන සංවර්ධන )

**විෂය සම්බන්ධීකරණය**

කේ.එල් නිල්මිණි පෙරේරා මෙය - නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (සමාජ විද්‍යා )

**සම්පත් දායකත්වය**

- සෝමා දීගල්ල මිය - ගුරු උපදේශක (සමාජ විද්‍යා - කැලණිය කොට්ඨාසය)
- ගයනි සංදීපා විජේසිංහ මිය - බප/කැල සුභාෂී රාජකීය ම.වි.

සියලු හිමිකම් ඇවිරිණි

පුරවැසි අධ්‍යාපනය - කෙටි සටහන්

11 ශ්‍රේණිය- දෙවන වාරය

1. වන පාඩම- ආණ්ඩුවේ විවිධ ස්තර



1. ශ්‍රී ලංකාව ඒකීය ආණ්ඩු ක්‍රමයක් පවතින රටකි.
   එනම් එක් මධ්‍යම බල මධ්‍යස්ථානයක් මත බලය ඒකරාශී වී තිබීමයි.නැතහොත් තනි මධ්‍යම ආණ්ඩුවක් මගින් ව්‍යවස්ථාදායකය, විධායකය, අධිකරණය කටයුතු මෙහෙය වන්නා වූ ආණ්ඩු ක්‍රමයක් ලෙස ද හැඳින්විය හැකිය.
2. අතීත ශ්‍රී ලංකාවේ මධ්‍යම ආණ්ඩුව හා ප්‍රාදේශීය පාලනයට දීර්ඝ ඉතිහාසයක් පවතී.

නිදසුන් :-

- රජුගේ පාලනයට ප්‍රාදේශීය ඒකක සැකසී තිබුණි. උත්තර,ප්‍රාචීන, දක්ඛිණ, පශ්චිම ලෙස පාලන ඒකක පැවතීම.
- අනුරාධපුර යුගය අගභාගය - රජරට, රුහුණු රට, මලය රට, දක්ඛිණ දේශය
- පොළොන්නරු යුගය - රජරට, දක්ඛිණ දේශය, දොළොස් දහස් රට, අට දහස් රට
- බ්‍රිතාන්‍ය පාලන සමය - දිසාව, කෝරල, පත්තු, ලෙස පරිපාලන කොට්ඨාස ක්‍රියාත්මක වේ.


3. ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය යටත් විජිත බවට පත් වීමෙන් පසු පාලන කටයුතු වල ඇති වූ වෙනස්කම්

| | | |
|---|---|---|
| 1833 | කෝල්බෲක් ආණ්ඩු ක්‍රම ප්‍රතිසංස්කරණ | ව්‍යවස්ථාදායක සභාව |
| 1910 | කෲව් මැකලම් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය | ව්‍යවස්ථාදායක සභාව |
| 1921 | මැනිං ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය | ව්‍යවස්ථාදායක සභාව |
| 1931 | ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය | රාජ්‍ය මන්ත්‍රණ සභාව |
| 1947 | සෝල්බරි ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය | ද්වි මණ්ඩල පාර්ලිමේන්තුව |

| **1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ සිදුවූ වෙනස්කම්** |
| --- |
| 1. ඩොමීනියන් තත්ත්වය අහෝසි කර ස්වාධීන ජනරජයක් බවට පත් වීම. |
| 2. අග්‍රාණ්ඩුකාර ධූරය අහෝසි කර ජනාධිපති ධූරයක් ඇති කිරීම. |
| 3. ශ්‍රී ලංකාවේ අවසාන හා ඉහළම උසාවිය ශ්‍රේෂ්ඨාධිකරණය ලෙස පිළිගැනීම. |
| 4. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණය පිහිටුවීම. |
| 5. මූලික අයිතිවාසිකම් පරිච්ඡේදය ප්‍රථම වරට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් කිරීම. |

| **1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ සිදු වූ වෙනස්කම්.** |
| --- |
| 1. විධායක බලය සහිත ජනාධිපති ධූරයක් ඇති කිරීම. |
| 2. විධායක ජනාධිපති ක්‍රමය අගමැති හා අමාත්‍ය මණ්ඩලයක් හඳුන්වා දීම. |
| 3. සරල බහුතර නියෝජන ක්‍රමය අහෝසි කර සමානුපාතික නියෝජන ක්‍රමය හඳුන්වා දීම. |
| 4. මූලික අයිතිවාසිකම් හඳුන්වාදීම හා ඒවා ආරක්ෂා කිරීමට අවශ්‍ය විධිවිධාන ව්‍යවස්ථාවට ඇතුළත් කිරීම. |
| 5. පාර්ලිමේන්තු කටයුතු කොමසාරිස් ධූරයක් ඇති කිරීම. (ඔම්බුඩ්ස්මන්) |


## ශ්‍රී ලංකාවේ මධ්‍යම ආණ්ඩුව සතු බලතල



ශ්‍රී ලංකාවේ පළාත් සභා ක්‍රමය -

1978 - 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ශ්‍රී ලංකාව පළාත් නවයකට බෙදා සෑම පළාතකම පළාත් සභාවක් පිහිටුවන ලදී.

- ශ්‍රී ලංකාවේ පලාත් නවය



ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන

*වර්තමාන ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන පළාත් පාලන ආයතන වර්ග තුනකි.

| <u>ආයතනය</u> | | <u>ප්‍රධානියා</u> |
|---|---|---|
| මහ නගර සභා | → | නගරාධිපතිතුමා |
| නගර සභා | → | සභාපතිතුමා |
| ප්‍රාදේශීය සභා | → | සභාපතිතුමා |

## ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන වලට පැවරී ඇති කාර්යයන්

**පොදු මංමාවත්**

- මංමාවත් නඩත්තු කිරීම
- අතුරු පාරවල් ඉදිකිරීම
- ජල මාර්ග හා ශුද්ධ පවිත්‍ර කටයුතු සඳහා නළ යෙදීම

**මහජන සෞඛ්‍යය**

- පොදු කාණු පද්ධතිය ඉදිකිරීම හා නඩත්තු
- මහජන වැසිකිළි ඉදිකිරීම හා නඩත්තුව
- අහිතකර ගොඩනැගිලි ඉවත් කිරීම
- මහජන සෞඛ්‍ය සේවා

**පොදු උපයෝගීතා සේවා**

- පොදු ස්ථානවලට විදුලි ආලෝකය ලබා දීම
- උයන් වතු ක්‍රීඩා පිට්ටනි පවත්වාගෙන යාම
- ජල සම්පාදන කටයුතු පවත්වාගෙන යාම
- පොදු කියවීම් ශාලා පවත්වාගෙන යාම

## 07. පළාත් සභා හා පළාත් පාලන ආයතන වල ප්‍රයෝජන:-

- මහජන උපයෝගීතා සේවා පහසුවෙන් ලබාගත හැකි වීම
- ප්‍රාදේශීය හා ජාතික නායකයින් බිහි වීමට පසුබිම සැකසීම
- ප්‍රාදේශීය සංවර්ධන කටයුතු ඵලදායි ලෙස ඉටුකර ගැනීම වේගවත් වීම
- සෞඛ්‍ය හා සනීපාරක්ෂක කටයුතු ඵලදායි ලෙස පවත්වාගෙන යාම

## 08. ප්‍රාදේශීය ඒකක වලට බලය විමධ්‍යගත කිරීමට හේතු

- ජනතාවගේ මූලික අවශ්‍යතා පහසුවෙන් ඉටු කිරීම
- ජනතාවට වඩාත් සමීප පරිපාලන ඒකකයක් පිහිටුවීම
- තරුණ නායකත්වය සඳහා අවස්ථා හිමිවීම
- මධ්‍යම ආණ්ඩුවේ කාර්යයන් ලිහිල් කිරීම
- පාලන කටයුතු වලට පුළුල් ජනතා සහභාගිත්වයක් ලබා ගැනීම

## 09. ප්‍රාදේශීය ඒකක වලට බලය විමධ්‍යගත කිරීමේදී මතුවන ගැටලු

- සම්පත් බෙදී යාමේ විෂමතාව නිසා සමහර ප්‍රාදේශීය ඒකක වලට වාසි හා අවාසි සිදුවීම.
- ප්‍රාදේශීයව ජනතා අවශ්‍යතා ඉටු කරගැනීමට යොමු විය යුතු ආකාරය පිළිබඳ ව ජනතාවගේ දැනුම ප්‍රමාණවත් නොවීම.
- සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීමට මුදල් උපයා ගැනීමේ දුෂ්කරතා
- බලතල ක්‍රියාවට නැංවීමේදී මධ්‍යම ආණ්ඩුව හා ප්‍රාදේශීය ඒකක අතර ගැටළු ඇති වීම.

## 10. පුරවැසියා කෙරෙහි ආණ්ඩුවේ විවිධ ස්ථරවල වගකීම හා වගවීම

| |
|---|
| නීතිය හා සාමය ආරක්ෂා කිරීම |
| මහජන උපයෝගීතා සේවා සංවිධානාත්මකව ලබාදීම |
| පොදු දේපල පවත්වාගෙන යාම |
| ප්‍රාදේශීය ආර්ථිකය වැඩි දියුණු කිරීම හා ජාතික සංවර්ධනය ඇතිකිරීම |

## 11. මධ්‍යම ආණ්ඩුව, පළාත් සභා, පළාත් පාලන ආයතන කෙරෙහි පුරවැසියාගෙන් ඉටුවිය යුතු යුතුකම් හා වගකීම්

| |
|---|
| ජාතික ආරක්ෂාව පවත්වාගෙන යාමට සහාය වීම |
| ප්‍රාදේශීය සංවර්ධනය සඳහා ක්‍රියාකාරීව සහයෝගය හා මගපෙන්වීම ලබා දීම |
| පරිසර කළමනාකරණයට දායක වීම |
| යහපත් පුරවැසියෙකු ලෙස සැම විටම කටයුතු කිරීම |

අභ්‍යාස:-

01. ඒකීය ආණ්ඩුක්‍රමයක ප්‍රධාන ලක්ෂණ දෙකක් නම් කරන්න.
02. විධායකය සතු බලතල හා කාර්යයන් තුනක් නම් කරන්න.
03. 1972 පළමු ජනරජ  ව්‍යවස්ථාව මගින් සිදුකළ වෙනස්කම් තුනක් ලියන්න.
04. 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රමය මගින් හඳුන්වා දුන් ප්‍රතිසංස්කරණ තුනක් ලියන්න.
05. ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය ඒකක වලට බලය විමධ්‍යගත කිරීමට බලපෑ හේතු දෙකක් නම් කරන්න.
06. බලය විමධ්‍යගත කිරීමේදී මතුවන ගැටලු තුනක් සඳහන් කරන්න.
07. පළාත් සභා හා පළාත් පාලන ආයතන වලින් අත්වන ප්‍රයෝජන තුනක් දක්වන්න.
08. වර්තමානයේ ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන පළාත් පාලන ආයතන වර්ග තුන නම් කරන්න.
09. ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන වලින් මහජන සෞඛ්‍යයට අදාළ ව සිදු කරන සේවා තුනක් නම් කරන්න.
10. මහ නගර සභාවලට පවරා ඇති කාර්යයන් තුනක් ලියන්න.
11. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව ව්‍යවස්ථාදායකය සතු බලතල හා කාර්යයන් නම් කරන්න.

12. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව ජනාධිපතිවරයා සතු ව්‍යවස්ථාදායක බලතල හා කාර්යයන් නම් කරන්න.
13. ශ්‍රී ලංකාවේ අධිකරණයට පැවරෙන බලතල හා කාර්යයන් මොනවාද?
14. පුරවැසියා කෙරෙහි ආණ්ඩුවේ විවිධ ස්ථර මගින් ඉටු කළ යුතු වගකීම් පහක් ලියන්න.
15. ජාතික ආරක්ෂාව පවත්වාගෙන යාම වෙනුවෙන් පුරවැසියාගෙන් ඉටුවිය යුතු වගකීම තුනක් ලියන්න.
16. පරිසර සංරක්ෂණයට දායක වීම සම්බන්ධයෙන් පුරවැසියාගෙන් ඉටුවිය යුතු යුතුකම් මොනවාද?
17. ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන තුන නම් කර එහි ප්‍රධානීන් නම් කරන්න.
18. ශ්‍රී ලංකාවේ පළාත් සභා වලට පැවරී ඇති කාර්යයන් බෙදා දැක්වෙන ප්‍රධාන තේමාවන් තුන නම් කර එහි කාර්යයන් ලියා දක්වන්න.
19. අතීත ශ්‍රී ලංකාවේ මධ්‍යම ආණ්ඩුව හා ප්‍රාදේශීය ඒකක අතර පාලනය සිදුකළ බවට ඒ ඒ යුගයන් අනුව නිදසුන් ලියන්න.
20. ශ්‍රී ලංකාවේ පළාත් සභා ක්‍රමය ඇති කරන ලද්දේ කුමන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ද?

# 03 වන පාඩම- මානව හිමිකම් හා යුතුකම්




1. මානව අයිතිවාසිකම් යනු :- මිනිසත් බව ලැබීම හේතු කොටගෙන පුද්ගලයකුට උපතින්ම ලැබෙන අයිතීන් ය. . පුද්ගලයාට ගරුත්වයෙන් හා සමානාත්මතාවයෙන් සමාජයේ ජීවත් වීම සඳහා මානව අයිතිවාසිකම් ඉවහල් වේ.
2. ඉතිහාසයේ විවිධ කාල වකවානුවල අයිතිවාසිකම් භුක්ති විඳීමේ දී විවිධ සීමාවන්ට යටත් විය. එවන් කාල වකවානු වනුයේ,

    වහල් යුගය
    වැඩවසම් යුගය

3. සමාජය ක්‍රමයෙන් දියුණුවත්ම මිනිසා තම අයිතිවාසිකම් දිනාගැනීම සම්බන්ධයෙන් විවිධ අරගල කරන්නට විය. එවන් ඓතිහාසික අවස්ථා 5 කි.

| | |
|---|---|
| ක්‍රි.ව.1215 | බ්‍රිතාන්‍යය මැග්නා කර්ටා ගිවිසුම |
| ක්‍රි.ව.1689 | බ්‍රිතාන්‍ය අයිතිවාසිකම් පිළිබඳ පනත |
| ක්‍රි.ව.1776 | ඇමරිකානු නිදහස් ප්‍රකාශනය |
| ක්‍රි.ව.1789 | මිනිස් සහ පුරවැසියන් පිළිබඳ විශ්ව ප්‍රකාශනය |
| ක්‍රි.ව.1917 | රුසියානු විප්ලවය |

4. අයිතිවාසිකම් සම්බන්ධ ක්‍රියාවලියේ පාර්ශව දෙක වනුයේ,
    - අයිතිවාසිකම් ඉල්ලා සිටින්නන්
    - අයිතිවාසිකම් ලබා දීමට බැඳී සිටින්නන්

5. මානව අයිතිවාසිකම් පිළිබඳ ලෝක ප්‍රජාවගේ අවධානය ඇති වීමට මුල් වූ ප්‍රධාන කරුණු වනුයේ,
    - ක්‍රි.ව.1914-1918 පළමු ලෝක යුද්ධය
    - ක්‍රි.ව.1939-1945 දෙවන ලෝක යුද්ධය ආරම්භ වීමත් සමග ලක්ෂ සංඛ්‍යාත ජීවිත අහිමිවීම
    - ආබාධිත තත්ත්වයට පත් වීම
    - කාන්තාවන් හා ළමුන් බිලියන ගණනක් අනාථ භාවයට පත් වීම යනාදී මානව අයිතීන් උල්ලංඝනය වීම.
6. මානව හිමිකම් සුරැකීම, ලෝක සාමය සුරක්ෂිත කිරීම, ජාතීන් අතර සහයෝගීතාවය වර්ධනය කිරීම පදනම් කරගෙන ලොව බිහි වූ සංවිධානය වනුයේ,

    1945 - එක්සත් ජාතීන්ගේ සංවිධානය

7. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය

**සියලුම මනුෂ්‍යයෝ නිදහස්ව උපත ලබා ඇත. ගරුත්වයෙන් හා සමාන අයිතිවාසිකම්වලින් සමාන වෙති. යුක්තිය අයුක්තිය පිළිබඳ හැඟීමෙන් හා හෘද සාක්ෂියෙන් යුතු ඔවුන්, ඔවුනොවුන්ට සැලකිය යුත්තේ සහෝදරත්ව හැඟීමෙනි.**

8. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ අරමුණු වනුයේ,
    - මානව අයිතිවාසිකම් ආරක්ෂා කර දීම
    - ජාතීන් අතර මිත්‍ර සබඳතා වර්ධනය කර ගැනීම
    - වඩා යහපත් ජීවන තත්ත්වයක් උදා කර දීම

9. අයිතිවාසිකම් වර්ග දෙකකි. → මානව අයිතිවාසිකම්
→ මූලික අයිතිවාසිකම්

10.මානව අයිතිවාසිකම් යටතට ගැනෙන ප්‍රධාන අයිතිවාසිකම් වනුයේ,

| |
|---|
| සිවිල් අයිතිවාසිකම් |
| දේශපාලන අයිතිවාසිකම් |
| සංස්කෘතික අයිතිවාසිකම් |
| සාමාජයීය අයිතිවාසිකම් |
| ආර්ථික අයිතිවාසිකම් |

11. සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් යටතට ගැනෙන අයිතිවාසිකම් ,

| |
|---|
| ජීවත්වීමට, නිදහස්ව සිතීමට, පෞද්ගලික ආරක්ෂාවට ඇති අයිතිය |
| ගමනාගමනයට ඇති නිදහස, ආගමික නිදහස |
| නීතිය ඉදිරියේ සමාන පුද්ගලයකු ලෙස පිළිගැනීමේ අයිතිය |
| නිදහස් මත දැරීම හා ප්‍රකාශ කිරීමට ඇති අයිතිය |
| රටේ පාලනයට සහභාගි වීමට ඇති අයිතිය |

12. ආර්ථික, සාමාජීය ,සංස්කෘතික ,අයිතිවාසිකම්

| |
|---|
| අධ්‍යාපනය ලැබීමට ඇති අයිතිය |
| වැඩ කිරීමට හා සමාන වැටුප් ලැබීමට ඇති අයිතිය |
| ආහාර, ඇඳුම් පැළඳුම්, නිවාස, සෞඛ්‍ය පහසුකම් ලබා ගැනීමේ අයිතිය |
| සංස්කෘතික, විද්‍යාත්මක, කලා කටයුතුවලට සහභාගි වීමට ඇති අයිතිය |
| පෞද්ගලික දේපළ දැරීමට ඇති අයිතිය |

13. එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් අන්තර්ජාතික මානව අයිතිවාසිකම් පනතට නීතිමය ලේඛන 6 ක් ඇතුළත් කිරීමට මූලික වූ අරමුණු:-

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයන්හි අයිතිවාසිකම් සඳහා නීත්‍යානුකූල භාවයක් ඇති කර ගැනීම.

14.සමාජය තුළ කාන්තාවන්ට එරෙහි ව සිදු වන සියලු ආකාරයේ වෙනස්කම් තුරන් කිරීම සඳහා පිහිටුවාගත් සම්මුතිය හා වර්ෂය :-

- සීඩෝ සම්මුතිය (CEDAW) - 1979 දෙසැම්බර් 18 සම්මුතිය සම්මත කිරීම
- 1981 සැප්තැම්බර් 03 ක්‍රියාත්මක කිරීම.

15.ලොව පුරා ප්‍රජාව මෙවන් සම්මුතියක් ඇති කර ගැනීමට පාදක වූ සාධක

- කාන්තාවන් ප්‍රචණ්ඩත්වයට ලක් වීම
- විවිධ අතවර වලට මුහුණ දීම හා සමාන අයිතිවාසිකම් සමාජයේ නොලැබීම.

16.සීඩෝ සම්මුතිය යටතේ කාන්තාවන්ට හිමි අයිතීන් වනුයේ

| |
|---|
| කාන්තාවන්ගේ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් |
| පවුල් ඒකකය තුළ කාන්තාවන්ගේ අයිතිවාසිකම් |
| අධ්‍යාපනයට ඇති අයිතිය |
| සමාජ වෙනස්කම් වලින් ආරක්ෂා වීමට ඇති අයිතිය |

17.ශ්‍රී ලංකාව මෙම සීඩෝ සම්මුතිය අත්සන් තබා ඇති වර්ෂය හා කාන්තා අයිතීන් සුරක්ෂිත කිරීමට ගෙන ඇති පියවර,

- 1981 වර්ෂය
- 1993 ශ්‍රී ලංකාව කාන්තා ප්‍රඥප්තිය සකස් කිරීම දණ්ඩ නීති සංග්‍රහයට ඇතුළත් කිරීම
- කාන්තා කටයුතු සම්බන්ධයෙන් වෙනම අමාත්‍යාංශයක් පිහිටුවීම
- සැම පොලීසියක ම කාන්තා කටයුතු සම්බන්ධයෙන් පැමිණිලි විභාග කිරීමට කාන්තා කාර්යාංශයක් පිහිටුවීම.



ළමා අයිතිවාසිකම් පිළිබඳ ලෝක ප්‍රජාවගේ අවධානය යොමු වීමට හේතු:-

- රට රටවල් තුළ ඇති වූ යුද ගැටුම් වලදී විශාල ළමා ජනගහනයක් අනාථ වීම
- දෙමව්පියන් අහිමි වීම
- වද හිංසා වලට ලක් වීම
- මිය යාම
- මන්ද පෝෂණයට ලක් වීම
- විවිධ ත්‍රස්තවාදී කණ්ඩායම් ළමුන් ළමා සොල්දාදුවන් ලෙස යොදා ගැනීම
- ළමා ශ්‍රමිකයින් ලෙස සේවයේ යෙදවීම

19. එක්සත් ජාතීන් විසින් ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය සම්මත කරගත් වර්ෂය හා එහි විශේෂ අරමුණු:-

1989 නොවැම්බර් 20 - එක්සත් ජාතීන්ගේ ජාත්‍යන්තර ළමා අරමුදල

(යුනිසෙෆ් - සංවිධානය)

unicef

- ආරක්ෂාව.
- පැවැත්ම.
- සංවර්ධනය.
- සහභාගිත්වය

20. ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය මගින් සහතික කර ඇති අයිතිවාසිකම්:-

| |
|---|
| යහපත් ජීවන තත්ත්වයක් ලබා ගැනීමේ අයිතිය |
| සෞඛ්‍ය හා පෝෂණය ට ඇති අයිතිය |
| ක්‍රීඩා කිරීම, විනෝදයෙන් සිටීමට ඇති අයිතිය |
| මත්ද්‍රව්‍ය වලින් ආරක්ෂා වීමට ඇති අයිතිය |

21. ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට ශ්‍රී ලංකාව ගෙන ඇති ක්‍රියාමාර්ග:-

- ළමුන් සම්බන්ධව ක්‍රියා කිරීමට ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පිහිටුවා පවත්වාගෙන යාම.
- පරිවාස හා ළමා ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව පිහිටුවීම
- සෑම පොලිසිය කම  ළමුන් සම්බන්ධව පැමිණිලි විභාග කිරීමට ළමා හා කාන්තා කාර්යාංශයක් පිහිටුවීම.




- ශ්‍රී ලංකා ළමා දුරකථන සේවය පිහිටුවීම - (Child Line Sri Lanka - 1929)

- මූලික අයිතිවාසිකම් භුක්ති විඳීමේ සීමා හා කඩ වූ විට ගත හැකි ක්‍රියාමාර්ග:-
    - මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කර තිබීම හෝ ඊට ආසන්නව තිබීම සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයට ඉල්ලීමක් කිරීමට පුළුවන.
    - මූලික අයිතිවාසිකම් කඩ වීම සම්බන්ධ පැමිණිලි ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම වෙත ඉදිරිපත් කළ හැකිය.
    - පරිපාලන ක්‍රියාවක් සම්බන්ධව අයිතිවාසිකම් කඩ වූ විට පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් වරයාට පැමිණිලි කළ හැකිය.
- ඔම්බුඩ්ස්මන් වරයා යනුවෙන් හඳුන්වනු ලබන්නේ,

  පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් තුමා ය.

- මානව හිමිකම් සුරැකීමේහිලා අදාල වන මූලික යුතුකම් වර්ග දෙක,

| නීතිමය යුතුකම් | සදාචාරාත්මක යුතුකම් |
|---|---|
| රජය විසින් පනවන බදු ගෙවීම | වැඩිහිටියන්ට ගරු කිරීම |
| නීති රීති පිළිපැදීම | සිරිත් විරිත් ඇගයීම. |

➢ මානව හිමිකම් සුරැකීමෙහිලා පවුලේ සාමාජිකයකු, පාසල් සාමාජිකයකු, රැකියාවෙහි නියුතු වන්නකු ලෙස ඉටු කළ යුතු යුතුකම්,

| | |
|---|---|
| පවුලේ සාමාජිකයකු | පවුලේ සාමාජිකයින් සමග සහයෝගයෙන් ඔවුනොවුන්ට ආදරය සෙනෙහස දක්වමින් පවුලේ ස්ථාවර පැවැත්මට කටයුතු කිරීම. |
| පාසල් සාමාජිකයකු | පාසලේ පොදු දේපල ආරක්ෂා කරගනිමින්, හොඳින් අධ්‍යාපන කටයුතු වල නිරත වෙමින් යහපත් පුරවැසියෙකු ලෙස අධ්‍යාපනය ලැබීම |
| රැකියා කරන්නකු | තම රැකියාව අවංකව, කැපවීමෙන්, ලබන වැටුපට සරිලන ශ්‍රමයක් ලබා දීම හා රටෙහි අභිවෘද්ධියට කටයුතු කිරීම. |

අභ්‍යාස :-

1. මානව අයිතිවාසිකම් දිනා ගැනීම සම්බන්ධයෙන් වැදගත්වන ඓතිහාසික අවස්ථා දෙකක් නම් කරන්න.
2. මානව අයිතිවාසිකම් අතරින් දේශපාලන අයිතිවාසිකම් දෙකක් නම් කරන්න.
3. ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය සකස් කිරීමේ දී සුවිශේෂී අධ්‍යාපන අවධානය යොමු කරන ලද අංග දෙකක් ලියන්න.
4. 'මෙලොව උපත ලබන සෑම පුද්ගලයකුට ම සමාන අයතිවාසිකම් ලබාගැනීමට හිමිකමක් ඇත.' සිවිල් අයිතිවාසිකම් දෙකක් නම් කරන්න.
5. ඔම්බුඩ්ස්මන්වරයා යනු කවුරුන්ද?
6. මානව අයිතිවාසිකම් අතරින් දේශපාලන අයිතිවාසිකම් දෙකක් ලියන්න.
7. මානව හිමිකම් වල ස්වභාවය අනුව බෙදා දැක්විය හැකි අයිතිවාසිකම් වර්ග තුන නම් කරන්න.
8. ශ්‍රී ලංකාවේ කාන්තාවන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග තුනක් නම් කරන්න.
9. පාසල් ශිෂ්‍යයකු ලෙස ඔබෙන් පාසලට ඉටු විය යුතු යුතුකම් තුනක් ලියන්න.
10. පුරවැසියෙකු විසින් ඉටු කළ යුතු සදාචාරාත්මක යුතුකම් තුනක් දක්වන්න.
11. සමාජයේ කාන්තාවන්ට සිදුවන වෙනස්කම් තුරන් කිරීම සඳහා පිහිටුවාගත් සීඩෝ සම්මුතියෙහි කාන්තාවන්ට හිමි අයිතිවාසිකම් තුනක් ලියන්න.
12. ළමා අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමට ශ්‍රී ලංකාව ගෙන ඇති ක්‍රියාමාර්ග තුනක් නම් කරන්න.
13. ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පුරවැසියෙකු ලෙස ඔබ විසින් ඉටු කළ යුතු සදාචාරාත්මක යුතුකම් තුනක් ලියන්න.
14. ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය මගින් සහතික කර ඇති අයිතිවාසිකම් තුනක් දක්වන්න.
15. එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය මගින් පිළිගෙන ඇති අයිතිවාසිකම් තුනක් සඳහන් කරන්න.
16. මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකාව ගෙන ඇති ක්‍රියාමාර්ග තුනක් නම් කරන්න.
17. ආර්ථික ,සමාජ, සංස්කෘතික, අයිතිවාසිකම් නම් කරන්න.